FORB Learning Platform

# Script: Limitations to freedom of religion or belief
# ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස සීමාකිරීම

බොහෝ රජයන් ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහසට සීමා පනවා ඇති බව ප්‍රවෘත්ති බැලීමෙන් සහ සමහර විට ඔබේම ජීවිත අත්දැකීමෙන් ඔබ දන්නවා ඇති. කවර හෝ හේතුවක් හෝ වෙනත් හේතුවක් නිසා ආගමික ප්‍රකාශන සීමා කළ යුතු බව ඔවුන් තර්ක කරනවා. එවැනි සීමාකිරීම් යුක්ති සහගත සහ අවසර දියහැකි සීමාකිරීම් බවක්, සහ එසේ නොවන අවස්ථාවල ඒ බවක් අපි දැන ගන්නේ කොහොමද?

ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය පවසන්නේ ආගමක් හෝ විශ්වාසයක් තබා ගැනීමට, තෝරා ගැනීමට, වෙනස් කිරීමට හෝ අත්හැරීමට ඇති අයිතිය නිරපේක්ෂ බවයි.- එය කිසිවිටෙකත් සීමා කල නොහැකියි. අනෙක් අතට, ආගමක් හෝ විශ්වාසයක් ප්‍රකාශ කිරීමේ අයිතිය සීමා කළ හැකි නමුත්, එසේ කරන්නට පුළුවන්නේ එක්තරා නීති හතරක් අනුගමනය කළ විට පමණයි.

එසේ පනවන ඕනෑම සීමාකිරීමක් සඳහා නීතියෙන් විධිවිධාන සලසා තිබිය යුතුයි.

එහෙම කර තිබෙන්නේ රජය, පොලීසිය සහ අධිකරණය අනපේක්ෂිත ලෙස හෝ නොගැලපෙන ලෙස ක්‍රියා කිරීම වැළැක්වීමයි.

මහජන ආරක්ෂාව, මහජන සාමය, සෞඛ්‍යය හෝ සදාචාරය හෝ අන් අයගේ අයිතිවාසිකම් සහ නිදහස ආරක්ෂා කිරීම සඳහා සීමා පැනවීම අවශ්‍ය වනවා.

මෙය වැදගත්. අනෙක් පුද්ගලයින් ආරක්ෂා කිරීමට අවශ්‍ය බැවින් සීමා පැනවීම, ඡන්ද දිනාගැනීමට ඉන් ලැබෙන වාසිය මත පදනම්ව සීමා පැනවීම ට වඩා බෙහෙවින් වෙනස් වනවා.

සීමාවන් වෙනස්කොට සලකනසුළු නොවිය යුතුයි.

පනවන ඕනෑම සීමාකිරීම, ඒ හා අදාළව ඇතිවී තිබෙන ගැටලුවට සමානුපාතික විය යුතුයි.

මෙම නීති ඇත්තෙන්ම වැදගත්. ඒවා නැතිනම්, කැමති ඕනෑම කණ්ඩායමක් හෝ පුහුණුවක් ව්‍යවහාරයක් මත සීමා පනවන්නට රජයට හැකිවේවි. සීමා පැනවීම කියන්නේ කළ හැකි අන් කිසිම දෙයක් නොමැතිවිට යොදාගන්නා දෙයක් මිස රාජ්‍ය පාලනය සඳහා වන මෙවලමක් නොවෙයි.

නීතිරීතිවල තේරුම සඳහා උදාහරණයක් වශයෙන් අපි මේ මනස්කල්පිත අවස්ථාව ගනිමු:

විවිධ ආගමික කණ්ඩායම් පහක් සිටින නගරයක් ගැන සිතන්න. ඔවුන් සියල්ලන්ටම පූජනීය ස්ථාන ඇති අතර ඒ සියල්ලෙන්ම යම් ශබ්දයක් නිකුත් වනවා. අසල්වාසීන් මේ ශබ්දවලට එතරම් කැමති නැහැ! නමුත් පොලිසියට පැමිණිලි ලැබෙන්නේ ජනප්‍රිය නොමැති එක් කුඩා ආගමික කණ්ඩායමක් ගැන පමණයි.

ඉහළ ශබ්ද නිතර ඇසීම සෞඛ්‍යයට අහිතකර වන අතර මහජන සෞඛ්‍යය කියන හේතුව මත සීමාකිරීම් පැනවීම නීත්‍යානුකූලයි. ඉතින් පළාත්පාලන ආයතනය කළ යුත්තේ කුමක්ද? මහජන සෞඛ්‍යය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන, වෙනස් කොට නොසලකන්නාවූ සහ සමානුපාතික වන නියාමනයක් වන්නේ කුමක්ද?

මෙම අවස්ථාවේ දී සුදුසු වන්නේ සියලු ප්‍රසිද්ධ රැස්වීම් සඳහා අවසර දෙන ශබ්ද පරිමාව නියාමනය කරන පොදු නීතියක්. සියලුම ආගමික කණ්ඩායම්වලට සහ අනෙක් අයට සමානව අදාළ වන නීතියක්. කිසියම් කණ්ඩායමක් නියම කළ ශබ්ද පරිමාව ඉක්මවා ගියහොත්, ශබ්දය අඩුකරන මෙන් නියම කිරීම හෝ දඩයකට මුහුණ දීම මෙම තත්වයට සමානුපාතික ප්‍රතිචාරයක් වනවා. සම්පූර්ණ නිශ්ශබ්දතාවයක් ඉල්ලා සිටීම හෝ ඔවුන් සියළුදෙනා එකිනෙකා හමුවීම තහනම් කිරීම සමානුපාතික වන්නෙ නැහැ!

ජනප්‍රිය නොවන කණ්ඩායම් පිළිබඳව පමණක් පොලිසියට පැමිණිලි ලැබුණත්, පොලීසිය සියළුදෙනා සම්බන්ධයෙන් නීතිය සමානව ක්‍රියාත්මක කළ යුතුයි. .

මෙය තරමක් කුඩා, සරල උදාහරණයක්.

ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස බරපතළ ලෙස උල්ලංඝනයවීම් දෙස බලන විට, මේ නීති  නොසලකා හැර ඇත්තේ සීමා කිරීම පැහැදිලි ලෙසම අනවශ්‍ය වන බැවින්, වෙනස්කොට සලකනසුළු බැවින්, හෝ සමානුපාතික නොවන බැවින් කියන කාරණාව අපට පහසුවෙන් දැක ගන්නට පුළුවනි.

සමහර රටවල් ඒ සඳහා ලියාපදිංචි ගොඩනැගිලිවලින් පිටත සිදුකරන සියලුම ආගමික කටයුතු තහනම් කර තිබෙනවා. ඔබේම නිවසේ රාත්‍රී ආහාරය ගැනීමට පෙර අමුත්තන් සමඟ ස්තුති කිරීමේ යාඥාවක් සිදුක කිරීම පවා ඒ නීති යටතේ තහනම් කර තිබෙනවා! පැහැදිලිවම මෙවැනි සීමා කිරීම් නීත්‍යානුකූල වන්නේ නැහැ!

නමුත්  මතභේදයට තුඩුදුන් නඩු බොහෝ සංඛ්‍යාවක් තිබෙනවා. ප්‍රංශයේ එක්තරා නගරයකයක නගරාධිපතිවරයෙකු විසින් බුර්කිනි නැමැති මුහුණ සහ පාද හැර ශරීරය සම්පූර්ණයෙන් ආවරණය වන පිහිනුම් ඇඳුම් තහනම් කිරීම් නිවැරදිද?  නැතහොත් ඉන්දියාවේ ඇතැම් ප්‍රදේශවල බලධාරීන් තමන්ගේ ආගම පිළිබඳ අනිත් අයට කීමට ඇති අයිතිය සීමා කිරීම නිවැරදිද?

සීමා කිරීම් නීත්‍යානුකූලදැයි තීරණය කිරීමේදී උසාවි විසින් ඇසිය යුතු ප්‍රශ්න හත දෙස අපි බලමු. ඔබට මුහුණ දෙන්නට වන සීමා කිරීම් තක්සේරු කිරීමට මෙය ඔබට උපකාරී වේවි.

**රජයෙන් යම් සීමා කිරීමක් පනවනවිට  මුලින්ම මෙම සීමා කිරීම තුළින් ආගමක් හෝ විශ්වාසයක් සහිතව සිටීමට හෝ පිළිගැනීමට ඇති පරම අයිතිය සීමා කෙරෙන්නේද  නැතහොත් ආගම හෝ විශ්වාසය ප්‍රකාශ කිරීම්ට ඇති අයිතිය සීමා කෙරෙන්නේද ප්‍රශ්නය සලකා බැලිය යුතුයි.**

සීමා කර ඇත්තේ පරම අයිතිවාසිකම් නම් රජයේ ක්‍රියාමාර්ග නීත්‍යානුකූල නැහැ.  නමුත් සීමා කර ඇත්තේ  ප්‍රකාශ කිරීම් නම් අපට මීළඟ ප්‍රශ්නයට යොමු වන්නට පුළුවනි.

**සීමා කර ඇත්තේ ආගම හෝ විශ්වාස ප්‍රකාශ කිරීම ද නැතහොත් හැසිරීමක් පමණද?**

බොහෝ අවස්ථාවලදී,  අප කරන කියන දෑ සඳහා මගපෙන්වන්නේ අපගේ විශ්වාසයි නමුත් අප කරන සියලුම දේවල් ආගම හෝ විශ්වාසය ප්‍රකාශ කිරීමේ අයිතියෙන් ආරක්ෂා වන්නේ නැහැ.  තමන්ගේ ආගම හෝ විශ්වාසය ප්‍රකාශ කිරීමේ අයිතිය සීමාවී ඇතැයි යමෙක් පැමිණිලි කළවිට අධිකරණය අදාල හැසිරීම ආගමක් හෝ විශ්වාසයක් ප්‍රකාශ කිරීම හා සම්බන්ධ දැයි තීරණය කිරීමට කටයුතු කරනවා. ඔවුන් මෙය සිදුකරන්නේ එම හැසිරීම සහ විශ්වාසය අතර ඇති සම්බන්ධතා දෙස බලා ඒවා සමීප ලෙස සම්බන්ධ දැයි සලකා බැලීම තුළින්.

සමහර විට මෙය පහසුයි. පල්ලියට යාම ක්‍රිස්තියානි ධර්මයට සමීපව බැඳී ඇති අතර නිරාහාරව සිටීම ඉස්ලාමයට සමීපව බැඳී තිබෙනවා.

නමුත් එය සැමවිටම සරල වන්නේ නැහැ. එක් කිතුනුවකුට කුරුසියක් ඇඳීම වැදගත් නැහැ; තවත් කෙනෙකුට එය ආගමික අනන්‍යතාවයේ ගැඹුරු ප්‍රකාශනයක්. මුස්ලිම් කාන්තාවන්ට හිස් ආවරණ පිළිබඳ විවිධ විශ්වාස තිබෙනවා.

මේවා අතරින් නිවැරදි වන්නේ කුමන විශ්වාස ද යන්න තීරණය කිරීම අධිකරණයේ කාර්යභාරය නොවේ. ආගමික ප්‍රකාශනයක් ලෙස සැලකිය යුතු දේ තීරණය කිරීමේදී, යම් යම් දේවධර්මීය මූලධර්මවලට වඩා වෙනත් මූලධර්ම සුදුසු යැයි සඳහන් වන තීන්දු ලබාදීමේ අවදානමට අධිකරණය මුහුණ දෙනවා. මානව හිමිකම් හිමිවන්නේ පුද්ගලයාටයි. එබැවින් ආගමික ආයතනමය මූලධර්ම වෙනුවට අධිකරණය අදාළ පුද්ගලයාගේ විශ්වාසයන් කෙරෙහි වැඩි වැඩියෙන් අවධානය යොමු කරනවා. එම පුද්ගලයා යම් ක්‍රියාවක් ආගම ප්‍රකාශ කිරීමක් ලෙස සලකන්නේ නම්, ඒ පුද්ගලයා සම්බන්ධයෙන් එය ආගම ප්‍රකාශකිරීමක් වනවා!

**නීතියේ ආරක්ෂාව ලබන ආගම ප්‍රකාශ කිරීමක් සීමාවට ලක් වන බව අපට තහවුරු වූ පසු, එම සීමා කිරීම සඳහා නීතියෙන් විධිවිධාන සලසා ඇති දැයි අප විසින් බැලිය යුතුයි.**

මෙම සීමා කිරීම් නියාමනය කරන්නාවූ ලිඛිත නීතියක්, නඩු තීන්දු නීතියක්, හෝ චාරිත්‍රානුකූල නීතියක් තිබේද? එසේත් නැතිනම් කිසිදු නෛතික පදනමකින් තොරව නිලධාරීන් විසින් මෙය පනවා තිබේ ද? ඒ අන්දමින් කිසිදු නෛතික පදනමකින් තොරව සීමාකිරීම පනවා ඇත්නම් එය නීත්‍යානුකූල නොවේ.

**මීළඟ පියවර වන්නේ එම සීමා කිරීම නීත්‍යානුකූල හේතුවක් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන්නේ දැයි සලකා බැලීමයි.**

මේ සඳහා පිළිතුරු ලබාදීමට, මුලින්ම අපි සීමාකරන ලද ව්‍යවහාරය සහ නීතියෙන් අවසර ලැබී ඇති හේතු අතරේ සෘජු සම්බන්ධතාවයක් තිබේදැයි බලන්නට අවශ්‍යයි. දෙවැනුව, එවන් සීමාකිරීමක් අවශ්‍ය වේ දැයි අප විසින් සලකා බැලිය යුතුයි. අපි මේ එක් එක් ප්‍රශ්නය වෙන වෙනම ගෙන බලමු.

ජාත්‍යන්තර නීතිය යටතේ ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස සීමා කළ හැකි එකම නීත්‍යානුකූල හේතුව වන්නේ මහජන ආරක්ෂාව, මහජන සාමය, සෞඛ්‍ය, හෝ සදාචාරය, හෝ අන්‍යයන්ගේ අයිතිවාසිකම් හා නිදහස් ආරක්ෂා කිරීමයි.

එසේනම් සීමාකිරීමට ලක්කර ඇති හැසිරීම ඔස්සේ ඉහත කී හේතු කෙරෙහි තර්ජන එල්ල වන්නේ කොයි ආකාරයටද? ඒ වාගේම ඒ සඳහා සාක්ෂි කිසිවක් තිබේ ද?

මෙහිදී සීමා කිරීම්ට ලක් කරන ව්‍යවහාරයන් සහ ඉහත කී නීත්‍යානුකූල හේතු අතර සෘජු සම්බන්ධතාවයක් පෙන්වා දීමට රජය විසින් කටයුතු කළ යුතුයි.

හින්දු කුල ක්‍රමය තුළ ඉහල හා පහල කුලවලට සහ කුල රහිත පුද්ගලයින් වශයෙන් පුද්ගලයින් කණ්ඩායම්වලට වෙන් කරනු ලබනවා. කුල රහිත පුද්ගලයින් ඉතාමත් බරපතළ ලෙස වෙනස්කොට සැලකීම් සහ සමාජමය හා ආර්ථිකමය වරප්‍රසාද අහිමිවීම් සඳහා මුහුණ දෙනවා. කුල රහිත හින්දු බැතිමතුන් ඇතැම් පූජනීය ස්ථානවලට ඇතුල්වීම තහනම් කර තිබුණා. 1949 දී මේ ක්‍රමය ඉන්දියාවේ අහෝසි කළ අතර කුල රහිත හින්දු බැතිමතුන්ට පූජනීය ස්ථාන කරා ප්‍රවේශවීම ප්‍රතික්ෂේප කිරීමට තවදුරටත් අවසර නැහැ. මෙම සීමාකිරීම ඉහත කී පරීක්ෂණයෙන් සමත් වනවා. කුලය මත පදනම් වී වෙනස්කොට සැලකීම් වැළැක්වීම සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් හා නිදහස් ආරක්ෂා කිරීම අතර සෘජු සම්බන්ධතාවයක් තිබෙනවා.

නමුත් හැම සීමා කිරීමක් සඳහා ම මෙවැනි පැහැදිලි සම්බන්ධතා නැහැ. ඇතැම් අවස්ථාවල දී රජය ඉහත කී නීත්‍යානුකූල හේතු වැරදි ලෙස නියෝජනය හෝ වැරදි ලෙස භාවිතය සිදු කරනවා.

ආගම ඇදහීමට හෝ විශ්වාස දැරීමට ඇති නිදහස සීමා කිරීම බොහෝ අවස්ථාවලදී මහජන සාමය සමගින් සම්බන්ධ කරනවා. තර්ජන, පහරදීම්, පුද්ගලයින් කුපිත කරවීම සහ ඇතැම් අවස්ථාවල දේවාපහාසය වැනි බොහෝ දේ නියාමනය කිරීම සඳහා මහජන සාමය සම්බන්ධයෙන් නීති පනවනවා.

ආගම හෝ විශ්වාස ප්‍රකාශ කිරීමේ නිදහසට, තමන් සැබෑවටම විශ්වාස කරන්නේ කුමක් දැයි ප්‍රකාශ කිරීම් ඇතුළත් වනවා. පැහැදිලිවම, තමන්ගේ විශ්වාස සාමකාමීව එසේත් නැතිනම් ප්‍රචණ්ඩත්වය සඳහා පුද්ගලයින් කුපිත නොකරවන අන්දමින් ප්‍රකාශ කළ හැකියි. එහෙත් කනගාටුදායක ලෙස ඇතැම් පුද්ගලයින්, සාමකාමී ලෙස තමන්ගේ විශ්වාස ප්‍රකාශ කිරීමෙන් පවා බෙහෙවින් අමනාප වන අතර ඔවුන් ඒවාට ප්‍රචණ්ඩත්වයෙන් පිළිතුරු දෙනවා.

කලහකාරී පිරිස් ප්‍රචණ්ඩ ක්‍රියාවල නිරතවීමේ අවදානම හේතුවෙන් මහජන සාමය ආරක්ෂා කිරීම යන නීත්‍යානුකූල හේතුව මත යැයි තර්ක කරමින් ඇතැම් රාජ්‍ය යම් යම් ආගමික විශ්වාස සාමකාමී ලෙස ප්‍රකාශයට පත් කිරීම තහනම් කර තිබෙනවා. ඉන්දුනීසියාව අහමදියානු සහ අදේවවාදී ආගමික විශ්වාස ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීම ඉහත කී හේතුව මත තහනම් කර තිබෙනවා. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, පහරදීම් සිදුකල වරදකරුවන්ට පහරදීම් සම්බන්ධයෙන් චෝදනා එල්ල කිරීම වෙනුවට වින්දිතයින් වෙත දේවාපහාසය හෝ පුද්ගලයින් කුපිත කිරීමේ චෝදනා එල්ල වන අවස්ථා තිබෙනවා.

මෙවැනි නීති හරහා ප්‍රචණ්ඩත්වය අඩු කරන්නට බැහැ. ඒ වෙනුවට ඒවායින් සිදු වන්නේ 'වැරදි විශ්වාස ඇති පුද්ගලයින්ට දඬුවම් පැමිණිය යුතුය' යන අදහස තවදුරටත් ශක්තිමත් කරවීමයි.

මහජන සදාචාරය යන සංකල්පය තවත් එවැනිම සංකල්පයක්. සදාචාරය සම්බන්ධයෙන් සියලු දෙනාටම ඇත්තේ සමාන අදහස් ද? සදාචාරය යනු පොදු සංකල්පයක්ද? සදාචාරය යන සංකල්පය

නිර්වචනය කළ යුත්තේ සමාජමය, දාර්ශනික සහ ආගමික සම්ප්‍රදායන් බොහොමයක් මත පදනම් වෙමින් බව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් විශේෂඥයින් පවසනවා. එනම්, බහුතර කණ්ඩායමේ සාරධර්ම මත පමණක් පදනම් වී සීමා කිරීම් පැනවිය නොහැකියි.

ජාතික ආරක්ෂාව ආගමේ හෝ විශ්වාසයේ නිදහස සීමා කිරීමේ නීත්‍යානුකූල පදනමක් නොවන බව දැනගැනීම ඔබ පුදුමයට පත් කළ හැකියි.

සමහර රටවල යම් යම් කණ්ඩායම්, විශේෂයෙන් සතුරු රටක ආගම බෙදා හදා ගන්නා කණ්ඩායම්, ජාතික ආරක්ෂාවට තර්ජනයක් ලෙස හඳුන්වනවා. මහජන සෞඛ්‍යය, ආරක්ෂාව සහ සාමය යන හේතු සීමාකිරීම් පැනවීම සඳහා ප්‍රමාණවත් ඉඩක් ලබා දෙන බවත්, ඊට ජාතික ආරක්ෂාව එක් කිරීම ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස වඩාත්ම අවශ්‍ය වූ විට එය අදාළ කරගත නොහැකි බවට පත් කරන්නේ යැයි සම්මුතිය කෙටුම්පත් කළ ලේඛකයින් එකඟ වී තිබෙනවා.

එබැවින්, සීමාවට ලක්කරන්නට යන ව්‍යවහාරයන් සහ නීත්‍යානුකූලව හේතුවක් අතර ඇති සෘජු සම්බන්ධතාවයක් පෙන්විය යුතුයි යන කාරණාව අපි දැන් තහවුරු කර කරගෙන තිබෙනවා. ඒ වාගේම අදාල කරගන්නා එම නීත්‍යානුකූල හේතු නිවැරදි අන්දමින් අර්ථකථනය කර සහ අදාළ කරගෙන ඇත්තේදැයි පරීක්ෂා කිරීම වැදගත් බවත් අපි දැන් දන්නවා

**අපගේ ප්‍රශ්නයේ දෙවන කොටස වෙත යමු - සීමා කිරීම අවශ්‍යද?** මෙය දේශපාලන හෝ බහුතර දෘෂ්ටිකෝණයකින් එතරම් ප්‍රියජනක මාතෘකාවක් නොවුනත් මෙය අවශ්‍ය වෙනවා.

ඔවුන් යෝජනා කරන සීමා කිරීම සහ අන්‍යයගේ අයිතිවාසිකම් සහ නිදහස ආරක්ෂා කිරීම අතර සෘජු සම්බන්ධයක් ඇති බව රජය පෙන්වා දී ඇති බව සිතමු.

*සීමා කිරීමට තරම් තර්ජනය බරපතලද?*

*යෝජිත සීමා කිරීම අනෙක් පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ඵලදයී වේද?*

*අයිතිවාසිකම් සීමා නොකර ගැටලුව විසඳීමට වෙනත් ක්‍රම තිබේද?*

ප්‍රශ්නය එතරම් බරපතළ නොවන්නේ නම්, යෝජිත සීමාකිරීම් ප්‍රශ්නය විසඳීමට දායක නොවන්නේ නම්, හෝ අයිතිවාසිකම් සීමා නොකර එය විසඳාගැනීමට හැකියාව තිබෙන්නේ නම් සීමා කිරීමක් අවශ්‍ය වන්නේ නැහැ.

අතිශයින් ජනාකීර්ණ බෞද්ධ පුහුණු මධ්‍යස්ථාන සෞඛ්‍ය සහ සුරක්ෂිතතාවයට ගැටලු ඇති කරන බවක් චීන රජයේ කියනවා. සෞඛ්‍ය සහ සුරක්ෂිතතාවය යනු සීමාකිරීම් පැනවිය හැකි නීත්‍යානුකූල හේතු සාධක වනවා. මෙහිදී අනුගමනය කළ හැකි එක් විසඳුමක් වන්නේ එම බම බෞද්ධ මධ්‍යස්ථාන අලුත්වැඩියා කර වඩාත් විශාල කිරීම සඳහා අවසර ලබා දීමයි. එම විසඳුම ඔස්සේ පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සීමා වන්නේ නැහැ. ඒ වෙනුවට රජය සිදුකළේ සමස්ත පරිශ්‍රයම කඩා බිඳ හෙලා භික්ෂුණීන් දහසක් බලහත්කාරයෙන් එම ස්ථානයෙන් ඉවත් කිරීමයි. එසේ කිරීමට අවශ්‍යතාවයක් තිබුණේ නැහැ.

ඇතැම් අවස්ථාවල දී සීමා කිරීම් සිදු කිරීම අවශ්‍ය වනවා. වැඩිහිටි බවට හඳුන්වාදීම සඳහා වන ඇතැම් චාරිත්‍ර සහ ස්ත්‍රී ලිංග ඡේදනය වැනි හානිදායක සාම්ප්‍රදායික ව්‍යවහාරයන් තහනම් කළ යුතු බව එක්සත් ජාතීන්ගේ සංවිධානය පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා.

ඇත්තෙන්ම, බොහෝ සිදුවීම් මෙතරම් ම පැහැදිලි නැහැ. එහෙත් සීමාකිරීමක් පැනවීම අවශ්‍ය යැයි ඔප්පුකිරීමේ භාරය පැවරිය යුත්තේ රජයටයි.

**රජයට නීත්‍යානුකූල හේතු ඇති බවත්, සීමාකිරීම පැනවීමේ අවශ්‍යතාවයක් ඇති බවත් තහවුරු කරගත් පසු, එම සීමාකිරීම වෙනස්කොට සලකනසුළු එකක්දැයි බැලිය යුතුයි.**

නීති, ප්‍රතිපත්ති සහ ව්‍යවහාරයන් වෙනස්කොට සලකනසුළුදැයි බැලීම පහසු කාර්යක් යැයි ඔබට සිතෙන්නට පුළුවනි. ඒවා ප්‍රකාශිතවම අදළ වන්නේ එක් පුද්ගල කොට්ඨාසයකට පමණක් නම්, එය අපහසු වන්නේ නැහැ. එය හඳුන්වන්නේ සෘජු වෙනස්කොට සැලකීම කියායි. එය නීතියට පටහැනියි.

නමුත් සියළුදෙනාටම අදාළ වන ඇතැම් නීති  සමාජයේ යම් කොටසක් මත බරපතළ බලපෑමක් ඇතිකරන අතර තවත් කොටසක් මත කිසිම බලපෑමක් ඇතිකරන්නේ නැහැ. මෙය හඳුන්වන්නේ වක්‍රාකාර වෙනස්කොට සැලකීම කියායි.

අප කලින් සිතේ මවාගත් නගරය සහ එහි ඝෝෂාකාරී ආගමික ස්ථාන කරා නැවතත් යොමුවෙමු. ප්‍රසිද්ධ උත්සව වලදී පවත්වාගත යුතු හඬ මට්ටම සම්බන්ධයෙන් නගරසභාවෙන් නීතියක් හඳුන්වාදුන් අතර ඒ අනුව ආගමික ප්‍රජාව තමන්ගේ ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය හැඩගස්වාගෙන තිබෙනවා. එහෙත් පල්ලියේ ඝාන්ඨාරය ශබ්ද අධික වන අතර ඒවායේ ශබ්දය අඩුකළ නොහැකියි. ප්‍රජාවේ අන් කිසිවකුටත් මෙය ගැටළුවක් නොවුනත් පල්ලියට තම සාම්ප්‍රදායික ව්‍යවහාරය නැවැත්වීමට සිදුවනවා.

මෙය වක්‍රාකාරව සිදුවන වෙනස්කොට සැලකීමක්.

වක්‍රාකාර වෙනස්කොට සැලකීම් සඳහා උදාහරණ ගණනාවක් සාමාන්‍ය නීතියෙන් ගෙනහැර දක්වන්න පුළුවනි:

බොහෝ රටවල ප්‍රසිද්ධ ස්ථානවලට පිහි රැගෙන යාම තහනම් කර තිබෙනවා. මෙය, සීක් ආගමිකයින්ට හැර අනෙකුත් බොහෝ ආගමික හෝ විශ්වාස කණ්ඩායම් වලට බලපාන්නේ නැහැ. සීක් ආගමික පුරුෂයින් තමන්ගේ කමිසයට යටින් කිර්පාන් නැමැති චාරිත්‍රානුකූල පිහියක් පැළැඳ සිටීම ආගමෙන් නියම කර තිබෙනවා. සීක් ආගමික පුරුෂයන්ට තමන්ගේ ආගමික නියමයන් ඉටු කිරීම මත නීතියෙන් සීමාවක් පනවා තිබෙනවා.

ඇතැම් රටවල නගර සැලසුම් රෙගුලාසි අනුව නව ගොඩනැගිලි ඉදිකිරීමේදී අසල්වාසී දේපලවල හිමිකරුවන්ගෙන් අවසර ගත යුතුයි. එහෙත් අසල්වාසීන් පක්ෂග්‍රාහී විය හැකියි. එනිසා කුඩා සහ සාම්ප්‍රදායික නොවන ආගමික කණ්ඩායම් වලට වඩා සාම්ප්‍රදායික ආගමික කණ්ඩායම් වලට එම අවසර ගැනීම පහසු විය හැකියි.

ප්‍රතිපත්ති හා ව්‍යවහාර මගින්ද ප්‍රශ්න ඇතිකළ හැකියි. විශ්ව විද්‍යාලයක් සෑමවිටකම තම ප්‍රවේශ විභාගය සෙනසුරාදා දිනයන්හි පවත්වන්නේ නම් ඇඩ්වෙන්ටිස්ට් සහ යුදෙව් ආගම අදහන්නන්ට එය අවාසියක් විය හැකියි. බොහෝ අවස්ථා වලදී, සුළුතර කණ්ඩායම් වල ශ්‍රමිකයින්ට ඔවුන්ගේ ආගමික උත්සව සඳහා නිවාඩු ලබාගැනීමට අවසර දීම වෙනුවට බහුතර ආගමික උත්සව දින වලදී නිවාඩු දින ලබා දීම සිදුවනවා.

සෘජු වෙනස්කොට සැලකීම් සෑම විටකම තහනම් කර තිබෙනවා. එහෙත් එසේ කිරීම යුක්තිසහගතව හැකි සෑම අවස්ථාවකදීම වක්‍රාකාර වෙනස්කොට සැලකීම්ද විසඳිය යුතු ප්‍රායෝගික ප්‍රශ්නයක් වශයෙන් අධිකරණ විසින් සැලකීම උචිත වනවා. බොහෝ අවස්ථා වලදී මේවාට සරල විසඳුම් සොයාගත හැකියි. අප කලින් සඳහන් කළ උදාහරණයේ නගරසභාවට ඉරිදා දිනවල සහ ආගමික උත්සව දිනවල පමණක් දේවස්ථානයේ ඝන්ඨා නාද කිරීමට ව්‍යතිරේකයක් සඳහා අනුමැතිය දිය හැකියි.

ස්වීඩනයේ විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාග මින් පෙර පැවැත්වූයේ සෙනසුරාදා දිනවලයි. එහෙත් දැන් ඒවා සිකුරාදා දිනවලත් පවත්වනවා. එමෙන්ම තලප්පා වැනි වෙනස්කම් ඇතුලත් කරගැනීමට හැකි අන්දමෙන් සේවා ස්ථාන වල නිලඇඳුම් ද හැඩගැස්විය හැකි නිලඇඳුම් බවට පත් කර තිබෙනවා.

එහෙත් සෑම විටකම මෙය සිදුකළ නොහැකි බව අධිකරණ පිලිගන්නවා. ඒ සඳහා හොඳ හේතුවක් ඇතිබව ඔප්පුකළ හැකි නම් සහ අපක්ෂපාතී හේතු දැක්වීමක් ඇත්තේ නම් වක්‍රාකාර වෙනස්කොට සැලකීම් නීත්‍යානුකූල විය හැකියි.

උදාහරණ වශයෙන් රෝහල් වල ආසාදන පාලන ප්‍රතිපත්තිය මගින් ආභරණ පැළදීම තහනම් කර තිබීම ඇතැම් කණ්ඩායම් වලට අවාසියක් වනවා. නමුත් මෙය මහජන සෞඛ්‍ය යන හේතුව පදනම් කරගෙන සාධාරණීකරනය වනවා.

ඇත්තෙන්ම, මහජන සෞඛ්‍ය යනු ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස සීමා කිරීම සඳහා නීත්‍යානුකූල හේතුවක් වනවා. එහෙත් වක්‍රාකාර වෙනස්කොට සැලකීම් සම්බන්ධයෙන් අධිකරන වෙනත් හේතූන්ද පිළිගන්නවා. උදාහරණ වශයෙන්, යම් සමාගමක ප්‍රතිපත්ති වෙනස් කිරීම එම සමාගමේ යහපතට හානිකර විය හැකි යැයි එම සමාගම තර්ක කරන්නට ඉඩ තිබෙනවා. තමන් අලෙවිකරන වර්ගයේ ඇඳුම් ඇඳ සිටීමට සේවකයින්ට නියමකරන ඇඳුම් සාප්පුවක් ආගමික හේතුමත එම ඇඳුම් ඇඳීම ප්‍රතික්ෂේප කරන පුද්ගලයකු සේවයට බඳවා ගැනීම ප්‍රතික්ෂේප කළ හැකියි.

ඒ අනුව, සෘජු වෙනස්කොට සැලකීම් තහනම් කර ඇති අතර පුද්ගලයින්ගේ හා කණ්ඩායම් වල අවශ්‍යතා සපුරාලීම සඳහා යුක්තිසහගත ක්‍රම හැකිතාක් දුරකට සොයාගැනීම ඔස්සේ වක්‍රාකාර වෙනස්කොට සැලකීම් මගහරවාගත යුතු වනවා.

**සිදුකරන සීමාකිරීම වෙනස්කොට සලකන සුළු සීමාකිරීමක් නොවන බව තහවුරු කරගත් පසු එය ප්‍රමාණානුකූලදැයි බැලිය යුතුයි.**

සීමාකිරීම කළයුත්තේ කුමන මට්ටමකටද? තහනම් කළ යුත්තේ කුමක්ද, කා සඳහාද, කොහේද, කුමන වේලාවකද?

මහමග ගමන්කරන සියලුදෙනාටම ආගමික ඇඳුම් ඇඳ සිටීම තහනම් කිරීමත් යම්කිසි සේවා ස්ථානයක් තුළ යම්කිසි වෘත්තීයකට අදාළව යම්කිසි අන්දමක ආගමික ඇඳුම් තහනම් කිරීමත් අතර විශාල වෙනසක් තිබෙනවා!

එබැවින් ජාත්‍යන්තර අධිකරණ ප්‍රමාණානුකූලභාවය දෙස බලනවා. එක්සත් ජනපදයේ අධිකරණ ඇතැම්විට ඊටත් වඩා දැඩි පරීක්ෂාවක් භාවිතා කරනවා.

**අවසාන වශයෙන් අධිකරන සලකා බලන තවත් එක් පැතිකඩක් වන්නේ රාජ්‍ය අභිමතයේ ආන්තිකයයි.** ලෝකය විවිධාකාර වන අතර මානව හිමිකම් මූලධර්ම එක් එක් රජයේ පසුබිම අනුව පදනම් වෙමින් විවිධාකාරයෙන් ක්‍රියාත්මක කළහැකියි.

මේ හේතුවෙන් ඇතැම් ජාත්‍යන්තර අධිකරන 'රාජ්‍ය අභිමතයේ ආන්තිකයක්' යොදා ගන්නවා. එනම් ජාතික පසුබිම වඩාත් හොඳින් අවබෝධ වන්නේ ජාතික බලධාරීන්ට වන බවත් එබැවින් ජාතික නීති සම්පාදනය සඳහා වඩාත් සුදුසු වන්නේ ඔවුන් වන බවත් පදනම් කරගනිමින් ජාත්‍යන්තර අධිකරණ ඔවුන්ට යම් අභිමතයක් ලබාදීමයි.

එසේ ලබාදෙන අභිමතය කොතරම් පුළුල් විය යුතුද යන්න සහ අධිකරන පමණට වඩා පුළුල් අභිමතයක් ලබාදෙන්නේද යන කාරණය විවාදයට තුඩු දෙන්නක්!

**සාරාංශ වශයෙන් සඳහන් කරනවා නම්:**

යම් සීමාකිරීමක් සඳහා අවසර දිය හැකිදැයි සිතා බැලීමේදී අප පහත ක්‍රියවලිය අනුගමනය කරනවා.

1. නීතියකින් ඔබේ ආගම හෝ විශ්වාසය පවත්වාගෙන යාමට හෝ වෙනස් කිරීමට ඇති පරම අයිතිය සීමා කරන්නේද නැතහොත් එහි ප්‍රකාශනය සීමා කරන්නේද යන්න තීරණය කිරීම.

2. සීමා කරන ලද හැසිරීම ආරක්ෂා කරන ලද ප්‍රකාශනයක්දැයි තීරණය කිරීම.

3. සීමා කිරීම සඳහා නීතිමය පදනමක් තිබේදැයි බැලීම.

4. අන්‍යයින්ගේ අයිතිවාසිකම් හා නිදහස වැනි සීමාකිරීමක් නීත්‍යානුකූල කරවන හේතු මත අදාල ප්‍රකාශනයෙන් ඇතිකරවන බලපෑම කුමන මට්ටමකදැයි තීරණය කිරීම.

5. අදාල සීමාකිරීම සෘජුව හෝ වක්‍රාකාරයෙන් වෙනස් කොට සලකන සුළුදැයි තීරණය කිරීම.

6. එම සීමාකිරීම, එල්ලවී ඇති තර්ජනයට ප්‍රමාණානුකූලද සහ ඊට මුහුණදීමට තරම් ඵලදායී වන්නේද යන්න සලකා බැලීම.

මානව හිමිකම් සඳහා අනුකූලතාවය දැක්වීමට අධිකරන විසින් යොදාගත යුතු තර්ක අපට තේරුම්ගත හැකි වූ විට අපට වඩාත් ඵලදායී ලෙස අපගේ අයිතිවාසිකම් සඳහා හිමිකම් පෑ හැකි වනවා. ඒ වගේම අධිකරන සහ ආණ්ඩු නිවැරදි අන්දමෙන් ක්‍රියාකරනවාද නැතහොත් ඔවුන් ආගම ඇදහීමට සහ විශ්වාස දැරීමට ඇති නිදහස උල්ලංඝනය කරනවාද යන කාරණය සම්බන්ධයෙන් ඇති මහජන විවාද සඳහා වඩාත් පූර්ණ වශයෙන් දායක වන්නට එමගින් අපට හැකියාව ලබාදෙනවා.

Copyright SMC 2018